ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**
විශේෂ කාර්ය බලකාය
(ශ්‍රී ලංකා පොලීසිය)

# ලංසු ආරාධනය (IFB)

## විශේෂ කාර්ය බලකාය වෙත 9mm x19mm උණ්ඩ මිලදී ගැනීම
## PS/03/PB/PR/08/25/2023

01. සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 14 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව විසින් පහත සඳහන් භාණ්ඩ සැපයීම සඳහා සුදුසුකම්ලත් හා අවශ්‍යතා සපුරා ඇති ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අනු අංක | ප්‍රසම්පාදන අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | ලංසු පෝරම ගාස්තුව රු. | ලංසු ඇපකරයේ වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 1. | PS/03/PB/PR/08/25/2023 | 9mm x19mm උණ්ඩ | 600,000 | 14,000.00 | 837,000.00 |

02. ලංසු කැඳවීම **ජාතික තරඟකාරී ලංසු ක්‍රමය** යටතේ සිදු කරනු ලබයි.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන් හට වැඩි විස්තර, **14 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ගණකාධිකාරී (ප්‍රසම්පාදන)** වෙතින් ලබා ගැනීමටද, ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දින වලදී **2023.09.21 දින සිට 2023.10.16** වන දින දක්වා **පෙ.ව 9.00 සිට ප.ව 3.00** අතර කාලයේදී **මූල්‍ය අංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 14 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** හිදී හෝ **(www.pubsec.gov.lk)** අපගේ නිල වෙබ් අඩවියෙන් ගාස්තු රහිතව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කළ හැකිය.

04. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරන ලද සියලුම ලංසුකරුවන්ට, අදාල භාණ්ඩ සැපයීමට නෛතික අයිතිය තිබිය යුතුය. ලංසුකරු තම ආයතනය ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචිකර තිබිය යුතු අතර, ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවේ වටිනාකම **රු. මිලියන 05 ට** වැඩිනම් 1987 අංක 3 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ (Public Contract Act) ලියාපදිංචි වී තිබිය යුතුය. මෙම ලියාපදිංචි සහතිකය ලංසුව සමග ඉදිරිපත් නොකිරීම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත. ලංසුකරුගේ නම රජයේ අසාධු ලේඛන ගත නොවිය යුතු ය. අමතර විස්තර ලංසු ලිපි ලේඛනවල සපයා ඇත.

05. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත්කර මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද ලංසු ලිපි ලේඛන කට්ටලයක් **ආපසු නොගෙවනු ලබන රුපියල් දාහතර දහසක (රු.14,000.00)** ලංසු පෝරම ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් **2023.09.21 දින සිට 2023.10.16** වන දින දක්වා රජයේ වැඩ කරන දිනයන්හි **පෙ.ව 9.00 සිට ප.ව 3.00** දක්වා කාලය තුළ ලබාගත හැක. එක් ආයතනයක් සඳහා එක් ලංසුවකට එක් ලංසු පෝරමයක් පමණක් නිකුත් කරනු ලැබේ.

06. ලංසු **පිටපත් දෙකක්** සහිතව, ලංසුව **2023.10.17 දින ප.ව 2.00 ට** හෝ ඊට පෙර **14 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය අංශයේ** තබා ඇති ලංසු බහාලනු ලබන ලංසු පෙට්ටියට බහාලීම හෝ ලංසුව විවෘත කරනු ලබන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් කෙළවර ඉහළ ලංසු අංකය පැහැදිලිව සටහන් කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද පෞද්ගලිකව පැමිණ සිටීමට රිසි ලංසුකරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් ඉදිරිපිටදී **14 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල මහජන ආරක්ෂක අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී 2023.10.17 වන දින ප.ව 2.00 ට** අදාල ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීම සඳහා සහභාගීවන ලංසුකරුවන්ගේ නියෝජිතයින් විසින් ලංසුකරුගේ ලිඛිත අවසරයක් අනිවාර්යෙන්ම රැගෙන ආ යුතුය. ලංසුකරුගේ ලිඛිත අවසරය ඉදිරිපත් කිරීමට අපොහොසත්වන කිසිදු නියෝජිතයෙකු ලංසු විවෘත කිරීම සඳහා සහභාගී කරනු නොලැබේ.

07. ඉදිරිපත් කරනු ලබන ලංසුවල **වලංගු කාලය 2023.10.17 වන දින සිට 2024.01.16 දින** දක්වා විය යුතුය. (ලංසු විවෘත කළ දින සිට **අවම වශයෙන් දින 91**)

08. සියලුම ලංසු, **රුපියල් අට ලක්ෂ තිස් හත් දහසක (රු.837,000.00)** ඇපකරයක් සමඟ ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන ඇපකරය පහත කොන්දේසි යටතේ විය යුතුය.

    i. මූල්‍ය සමාගමක් වශයෙන් මහ බැංකුවේ ලියාපදිංචි ආයතනයක් වෙතින් ලබාගත් ඇපකරයක් විය යුතුය.
    ii. ලංසු ඇපකර ආකෘති පත්‍රය ලංසු පෝරම කට්ටලයේ IV වන කොටසේ ඇතුළත් පෝරමය පරිදි විය යුතුය.
    iii. ලංසු ඇපකරය ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය "Secretary, Ministry of Public Security" නමින් විය යුතුය.
    iv. ලංසු ඇපකරයේ වලංගු කාලය **2023.10.17 වන දින සිට 2024.02.13** දින දක්වා විය යුතුය. (ලංසු විවෘත කළ දින සිට අවම වශයෙන් **දින 119**)

09. **2023.10.04** වන **දින ප.ව. 2.00 ට ශ්‍රවණාගාරය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 14 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** හිදී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත.

10. කලින් කලට වෙනස් වන මුදල් රෙගුලාසි සහ භාණ්ඩාගාරයේ උපදෙස් චක්‍රලේඛයන්ට අදාලව අවශ්‍ය සංශෝධනයන් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී සිදු කිරීම ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකළ හැකි අතර, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය ලෙසට සැලකිය යුතුය.

11. **ලංසු කරුවන්ගේ විශේෂ අවධානයට**

ලංසු ලේඛන නිකුත් කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා පැමිණීමට ප්‍රථම **caminlofinance@gmail.com** විද්‍යුත් ලිපිනයට හෝ **ෆැක්ස් අංක 0112887916** වෙත අවශ්‍ය ලංසු ලේඛන පිළිබඳ තොරතුරු යොමුකර පෙර දැනුම්දීමක් සිදුකර පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

12. පහත සඳහන් ලිපිනය මගින් හෝ දුරකථන අංක මගින් මේ සම්බන්ධව වැඩිදුර විමසීම් සිදුකළ හැක.

| ලිපිනය | දුරකථන අංක |
|---|---|
| ප්‍රධාන ගණකාධිකාරී, | සෘජු දුරකථන අංකය :- 011- 2887328 |
| 14 වන මහල, "සුහුරුපාය", | පොදු දුරකථන අංක :- 011- 2886067 |
| ශ්‍රී සුභූතිපුර පාර, | ෆැක්ස් අංකය :- 011- 2887784/2887916 |
| බත්තරමුල්ල. | |

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**මහජන ආරක්ෂක අමාත්‍යාංශය,**
**14 වන මහල, "සුහුරුපාය", සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**